# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,910 — 1970 ජුනි 11 වැනි බ්‍රහස්පතින්ද — 1970.6.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි හැම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | | | | පිට |
|---|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | | ... | | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | | ... | | 439 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | | ... | | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය | | ... | | — |
| වෙනත් පත් කිරීම් ආදිය | — | — | ... | 439 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | | — | — | — |

| | | | | පිට |
|---|---|---|---|---|
| ආණ්ඩුවේ නිවේදන | — | — | — | 440 |
| මිළ පාලන දැන්වීම් | — | — | — | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | | — | — | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | | — | ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ | | — | ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | | — | — | 441 |
| " සුරාබද්ද ආඥාපනත " පිළිබඳ දැන්වීම් | | — | — | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 194**

අංකය : ඩී. 264/ආර්ජීසීපී/බී.

### යුධ හමුදාව—ස්ථිර බල හමුදාව—රාජකාරිවල යෙදීම අත්හිටවන ලද නිලධාරීන්—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් නැවත සේවයට පත් කිරීම

තමන්ගේ රාජකාරිවල යෙදීම අත්හිටවන ලද පහත සඳහන් නිලධාරීන් 1970 මැයි මස 30 වැනි දින සිට නැවත සේවයට පත් කරනු ලැබේ :—

කපිතාන් දුලිප් සිං උපවංශ වීරසිංහ, ශ්‍රී.ලං.කා.හ.
කපිතාන් ප්‍රසන්න ගුණසීලු සේනානු පණ්ඩිත දහනායක, ල.සි.රෙ.
කපිතාන් ලියනගේ ගුනසෝම ධිගේරා, ල.යු.යු.බ.
ලුතිනන් ආතර් රන්ජිත් පෙරේරා විජේරත්න, ල.සි.රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ඊ. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1970 ජූනි මස 2 වෙනි දින,
කොළඹදී ය.

6-242

## වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 195**

අංකය : ඊබී/ඒ-204/3.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද නිවේදන යෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අනුරාධපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ සහකාර ඒජන්ත ආර්. බී. රණතුංග මහතා 1970 අප්‍රියෙල් මස 7 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, අනුරාධපුරයේ අතිරේක සහකාර බන්ධනාගාර අධිකාරි.

මහනුවර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ සහකාර ඒජන්ත එල්. ඒ. උඩුගවල මහතා, 1970 මැයි

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


439—3 69750—10,635 (70/6)

මස 9 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, මහනුවර පාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පිස්කල්.

ඒ. අයි. මොහිඩීන්,
ස්ථිර ලේකම් වෙනුවට.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 මැයි මස 25 වැනි දින.

6-106

---

# ආණ්ඩුවේ නිවේදන

## මුද්දර ආඥපනත

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥපනතේ 6 වන වගන්තිය යටතේ මුදල් ඇමති විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1970. 6. 3 දින,
කොළඹ දී ය.

**ව්‍යවස්ථාව**

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥපනතේ 6 වන වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 1970 මැයි 8 වැනි දින 14,905 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 75 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුළත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"76. 1970 ආසියානු නිෂ්පාදන වර්ෂය සැමරීම පිණිස කෘෂි කාර්මික හා කර්මාන්ත නිෂ්පාදන සංකේත පිළිබිඹු කෙරෙමින් නිකුත් කළ ශත 60 වටිනාකමින් යුක්තවූ තැපැල් හා ආදායම් මුද්දර".

6-317

---

## තැපැල් කාර්යාලීය ආඥපනත

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥපනතේ 16 වැනි වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970 ජූනි 6 දින,
කොළඹ දී ය.

**ව්‍යවස්ථාව**

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥපනතේ 16 වැනි වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1970 මැයි 8 වැනි දින 14,905 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 76 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුළත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"77. 1970 ආසියානු නිෂ්පාදන වර්ෂය සැමරීම පිණිස කෘෂි කාර්මික හා කර්මාන්ත නිෂ්පාදන සංකේත පිළිබිඹු කෙරෙමින් නිකුත් කළ ශත 60 වටිනාකමින් යුක්ත වූ තැපැල් හා ආදායම් මුද්දර."

6-318

---

අංකය : සී. 39/බී/සීර්ආර් (iii).

අංක 8,029 හා 1934 ජනවාරි මස 26 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද රෙගුලාසි අනුව, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ, යුද්ධ හමුදාවේ සෙවචණ බලසේනාවේ පහත නම් සඳහන් අය හට කාර්යක්ෂමතා පදක්කම (ලංකා) හෝ එයට සන්ධාරය ප්‍රධානය කර තිබේ :—

**කාර්යක්ෂමතා පදක්කම (ලංකා)**

1312 මාණ්ඩලික සැරයන් කොතලාවල, දොන් එදිරිසේන, ල.සු.වෛ.බ. (ස්වේ.)

**2 වෙනි සන්ධාරය**

1040 බලලත් නිලධාරී II ගොඩමුනේ, ජෝසප් සෙල්වෙරියස්, ල.යු.වෛ.බ. (ස්වේ.)

උතුමාණන් වහන්සේගේ අණපරිදි,
ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මැයි 22 වන දින,
කොළඹදීය.

6-161

---

ඇල්. ඩී. බී. 12/68.

## 1968 අංක 14 දරන සංචාරික සංවර්ධන පනත

### 57 වගන්තිය යටතේ නිවේදනය

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතෙහි 57 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, ජූනියස් රිචඩ් ජයවර්ධන වන මම, මෙමගින්, බෙන්තොට ජාතික නිවාඩු නිකේතය සඳහා නිකේත අධිකාරියක් සංස්ථාපනය කරන අතරම, එයට "බෙන්තොට නිකේත අධිකාරිය" යන නාමය පවරමි.

ජේ. ආර්. ජයවර්ධන,
රාජ්‍ය ඇමති.

1970.5.16,
කොළඹ.

6-156

---

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස් වූ ජී. ඒ. පියදාස මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා රැකීරක්ෂා ඇමතිතුමන් විසින් ඊ. එල්. ද එස්. නානායක්කාර මහතා පත්කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. පී. තම්බයියා,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 මැයි මස 23 වැනි දින,
කොළඹදීය.

6-149

---

අංකය : පී. 7/852.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, මන්සූර් ගොඩනැගිල්ල, 2 වන මහල, මල්වත්ත පාර, කොළඹ 11, හා ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 5, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීපා මොහමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශෙෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 12, වෙල්ල වීදියේ අංක 397 හි ඒ. ඇම්. ජී. ද සිල්වා මහතා මෙයින් පත් කරනු ලැබේ.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 මැයි මස 25 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරාවුල් පනත

**සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, මන්සූර් ගොඩනැගිල්ල, 2 වන මහල, මල්වත්ත පාර, කොළඹ 11**

**සහ**

ලංකා ගමනාගමන මණ්ඩලය අංක 200, කිරුළ පාර කොළඹ 5, අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය සහ ලංකා ගමනාගමන මණ්ඩලය අතර ආරාවුලට හේතුවී ඇති කරුණ නම් (ඉහත සඳහන් කරන ලද සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය විසින්) තම සාමාජික—ඇස්. සී. දයානන්ද මහතාට (කුරුණෑගල ඩිපෝවේ ලිපිකරු) රු. 75ක විශේෂ ජීවනාධාර මුදලක් ගමනාගමන මණ්ඩලයේ සේවයට පත් කරන ලද දිනයේ සිට ගෙවනසේ කර ඇති ඉල්ලීම යුක්තිසහගතද ? ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1970 මැයි මස 16 වැනිදා වූ මෙදින කොළඹ, කම්කරු කොමසාරිස් ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

6-154

---

අංකය : සී/අයි 1.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

**4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10, හා කොළඹ මහ නගර සභාව, කොළඹ, අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීපා මොහමඩ් වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශෙෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 3, 10 වැනි පටුමගේ අංක 32 හි ඊ. ජෙයවීරසිංහම් මහතා මෙයින් පත්කරනු ලැබේ.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 මැයි මස 25 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරාවුල් පනත

**සමස්ත ලංකා පළාත් පාලන කම්කරු සමිතිය, 67, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10**

**සහ**

**කොළඹ මහ නගර සභාව, කොළඹ**

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණ නම්, කොළඹ මහ නගර සභාව විසින් ඩබ්ලිව්. වී. සිරිසේන මහතාට (බී. 4232) රු. 15ක් දඩගැසීම හා ඔහුගේ වාර්ෂික වේතනාධිකය නැවැත්වීම යුක්ති සහගතද ? ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1970 මැයි මස 14 වැනිදා වූ මෙදින කොළඹ කම්කරු කොමසාරිස් ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

6-155

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : නීති/ණ/3.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම**

ජාතික නිවාස ආඥාපනතේ අංක 9 (1) බී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන මගින් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන ධන්පාල සිරිසේන වීරසිංහ වන මම, ලංකාණ්ඩුව සඳහාත් වෙනුවෙනුත් ක්‍රියා කරමින් කොළඹ ජී. ටී. බී. මාකලන්ද්, ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1966.2.27 දින අංක 505 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, වී. ඩී. ජෙරෝම් මහතාගෙන් 1969.11.15 දින තෙක් අයවිය යුතු රුපියල් හැට අටදස් නමසිය අටයි ශත දහය (රු. 68,908.10) අයකර ගැනීම සඳහාත්, එසේම 69.11.15 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් හතලිස් හතරදස් නමසිය විසිපහයි (රු. 44,925) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට හතර (4%) ප්‍රමාණයට යථෝක්ත උකස්කර ප්‍රකාර 69.11.15 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේත් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා රාජගිරිය, නාවල පාරේ, අංක 443 හි ජී. සී. නානායක්කාර ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2, 1970.4.10.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලෙපත්තුවේ පන්නිපිටියේ පිහිටි උතුරින් : ඩබ්. කෝවිස් අල්විස්ට අයත් මෙම ඉඩමේම කොටසකින්ද : නැගෙනහිරින් : මෙම ඉඩමේම අංක 2 දරණ කැබැල්ලෙන්ද (පාරට වෙන් කරන ලද බිම) ; දකුණින් : පන්සල පාරෙන් සහ බටහිරින් : ප්‍රැන්සිස් අමරසේකර ඇන් අයිති මෙම ඉඩමේම කොටසකින්ද මායිම් වූ ජේ. ඒ. ඩබ්. ගුණවර්ධන බලයලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 84 හා 1955.8.26 දින දරණ මානක සැලැස්ම අනුව රූඩ් එකක (අක්. 0, රූ. 1, ප. 0) ප්‍රමාණයෙන් යුත් කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක එම්—591/293 යටතේ ලියාපදිංචි කරනි ගොන්නගහවත්ත නොහොත් ගෝනගහවත්ත නමැති ඉඩමේ අංක 1 දරණ බෙදා වෙන් කරන ලද කොටස සහ එහි තනා ඇති නිවාසය සහ සියළුම දේත්.

6-188

---

## 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි

1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසිවල 3 වන රෙගුලාසිය ප්‍රකාර, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත, ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න වන මම, පහත සඳහන් කාලය 1952 තිස්සමහාරාම වන්දනා රෙගුලාසි බලපවත්වන කාලයක් වශයෙන් මෙයින් නියම කරමි.

**1970 පොසොන් උත්සවය—තිස්සමහාරාමය**

1970 ජූනි මස 16 වන දින සිට 1970 ජූනි මස 20 දින දක්වා (දෙදිනම ඇතුළුව).

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
හම්බන්තොට ආණ්ඩුවේ ඒජන්ත.

1970 මැයි මස 25 වන දින,
හම්බන්තොට කච්චේරියේ දීය.

6-162

## 1970 ආසියානු නිෂ්පාදන වර්ෂය සැමරීම සඳහා විශේෂ මුද්දර නිකුත් කිරීම

1970 ආසියානු නිෂ්පාදන වර්ෂය සැමරීම සඳහා 1970 ජූනි 17 දින ශත 60 වටිනාකමින් යුක්තවූ විශේෂ මුද්දර නිකුත් කරන බව මහජනයා වෙත මෙයින් දනුම් දෙනු ලැබේ. මෙම මුද්දර 1970 දෙසැම්බර් 31 දින හෝ මුද්දර තොගය අවසන් වන දිනය යන මේ දෙදිනෙන් කලින් එළඹෙන දිනයතෙක් අලෙවිය සඳහා තබනු ලැබේ. මෙම කාලය තුල ශත 60 වටිනාකමින් යුක්තවූ දනට පවත්නා මුද්දර කාණ්ඩයන් අලෙවි කිරීම අත්හිටුවනු ලැබේ.

2. ශත 60 මුද්දරය කෘෂිකාර්මික හා කර්මාන්ත නිෂ්පාදන සංකේත පිළිබිඹු කෙරේ.

ස. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

1970 ජූනි 1 දින.
කොළඹ 1,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේදීය.

6-190

---

## ප්‍රකාශනයයි

යාපනය දිස්ත්‍රික්කයේ වඩමරාච්චි දකුණ හා බටහිර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයට අයත් පුලෝලි ප්‍රදේශයේ පිස්සුබලු උවදුර පවතින බැව් මට ඒත්තු ගොස් තිබෙන නිසා, එම, පුලෝලි ගම්සභා ප්‍රදේශයේ සීමාවට අයත් සියලුම ප්‍රදේශ පිස්සුබලු උවදුර පවතින හෝ පැතිරීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස මෙම ගැසට් නිවේදනය පළවූ දා සිට මාස 6 ක කාලයක් යනතුරු පිස්සු බලු ආඥාපනතේ (476 වන පරිච්ඡේදයේ) 11 වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරමි.

2. ප්‍රකාශයට පත් කරන ලද යථෝක්ත ප්‍රදේශය තුළ, පුද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක, හෝ ඉඩමක හැර ප්‍රසිද්ධ ස්ථානයකදී, පාරකදී හෝ වෙන යම් ස්ථානයකදී හමුවන, පටියකින් බැඳගෙන හෝ කෙනෙකු විසින් ගෙන යනු නො ලබන ඕනෑම බල්ලකු දුටු වහාම මරා දැමීමට ඉඩ තිබේ.

ආර්ජ්. සී. පීටර්ස්,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

31.5.70,
කච්චේරිය,
යාපනය.

6-191

---

## වන්දනා ගමන් ආඥාපනත

**1960 ජූනි මස 3 වැනි දින අංක 12,139 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ද, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ද පළකරණ ලද ප්‍රකාශයෙන් සංශෝධිත වන්දනා ගමන් ආඥාපනත (133 වැනි ඡේදය) යටතේ අනුරාධපුර පූජනීය නගරය සම්බන්ධව පනවන ලද රෙගුලාසිවල, 3 වැනි රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

1970 පොසොන් වන්දනා වාරය 1970 ජූනි මස 16 දින ආරම්භ වී 1970 ජූනි මස 21 වැනි දින අවසන් වන බව සාමාන්‍ය දැනගැනීම සඳහා මෙයින් දනුම් දෙමි.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ
සාමාන්‍යාධිකාරී.

1970 මැයි මස 31 වෙනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

6-192

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| **ජූනි** | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6 11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| **ජූලි** | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70 7 10 සිකුරාද | 70 7 2 බ්‍රහස්පතින්ද | පෙ ව | 12 0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | පෙ.ව. | 12.0 |
| **අගෝස්තු** | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| **සැප්තැම්බර්** | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| **ඔක්තෝබර්** | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| **නොවැම්බර්** | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | පෙ.ව. | 12.0 |
| **දෙසැම්බර්** | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි